**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - 2017**

**-----------------------------------------------------**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (අධිකාරිය) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගනනය කළ විගණන මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගනනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

---------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවල අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං.රා.ගි.ප්‍ර)

-------------------------------------------------------

උපදේශක හා බේරුම් කිරීමේ සේවා වලින් ලද ආදායම් රු.1,242,173 ක් මූල්‍ය වාර්තාවල උපචිත පදනම වෙනුවට මුදල් පදනම මත ගෙන තිබූ අතර ලැබිය යුතු ආදායම් ගණනය කර උපචිත පදනමට ගිණුම්වලට ගැනීමට ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර.01 - ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.11,328,829 ක් වූ ප්‍රයිම් මුවර්ස් සමඟ වූ ටෙලරය මිලදී ගැනීමේදී දරන ලද රු.1,246,171 ක් වූ එකතු කල අගය මත වූ බදු මුදල් ද ලැබිය යුතු වැට් ලෙස පෙන්නුම් කරනු වෙනුවට වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) පෙර වර්ෂයන්හි උපකරණ ක්ෂය රු.710,937ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විලම්බිත ආදායම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වුනි.

(ඇ) 2016 වර්ෂයේ මිලදී ගත් රු.2,541,072 ක් වූ කම්පන රෝලය හා 2015 වර්ෂයේ මිලදී ගත් වායුසමීකරණ පද්ධතිය සඳහා වූ විලම්භිත ආදායම මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 01 යටතේ රු.4,796,230 ක් වූ අබලි ද්‍රව්‍ය තොගයට අදාලව වෙන් කිරීමක් කර නොතිබුණි.

(ඉ) ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.828,681 ක් 2017 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. එම නිසා 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුනි.

#### 2.2.3 හඳුනා නොගත් වෙනස්වීම්

----------------------------

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය අනුව විලම්භිත ආදායම රු.52,679,292 ක් විය. කෙසේ වුවද, විස්තරාත්මක උපලේඛනයේ එම ශේෂය රු.52,360,082 ලෙස දැක්වුනි. ඒ අනුව එම ශේෂයන් දෙක අතර රු.319,210 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද ණයහිමියන්ගේ සහ ණයගැතියන්ගේ කාල විශ්ලේෂණය අනුව 2017 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ වර්ෂ 03 කට වැඩි කාලයක් පිළිවෙලින් පැවති රු.5,566,779 ක් හා රු.3,052,679 ක් විය. එයින්, රු.384,110 ක් හා රු.1,032,617 ක් පිළිවෙලින් වර්ෂ 05 කට වැඩි නිරවුල් නොකළ මුදල් විය.

(ආ) 2012 වර්ෂයේ සිට දිගුකාලයක පැවති ලැබිය යුතු රු.6,761,278 ක් වූ ණයගැති ශේෂයක් ණයගැති නිරවුල් කිරීමේ ගිණුමකට මාරු කර තිබූ අතර රු.1,540,092 ක් 2012 සිට 2017 කාලපරිච්ජේදයේදී පියවාගෙන තිබුණි. එයින් රු.5,220,386 ක් වූ ශේෂයක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ණයගැති නිරවුල් කිරීම් ගිණුමේ රැදී තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට පවතින එකතුව රු.1,952,115 ක කලින් ලැබූ ආදායම් අත්තිකාරමක් ආදායම් ලෙස හදුනා ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වුනි.

### 2.2.5 අසම්භාව්‍ය බැරකම්

අධිකාරිය විසින් සේවය අවසන් කිරීම් හේතුවෙන් සේවකයන් අධිකාරියට විරුද්ධව නඩු 04 ක් පවරා තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි.

## 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| රජයේ ප්‍රසම්පාදන මගපෙන්වීම් | |
| i. මගපෙන්වීම් 2:11:2 | අධිකාරිය විසින් පැමිණීමේ ලේඛනයක් ප්‍රසම්පාදන කමිටු වෙනුවෙන් නඩත්තු කර නොතිබුණි. |
| ii. මගපෙන්වීම් 3:4:3 | අධිකාරිය විසින් 2010 වර්ෂයේ සිට සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.10,044,982 ක අතිරික්තයක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,065,799 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.20,110,781ක වර්ධනයක් දැක්වුණි. ශිල්ප සවිය වැඩසටහන යටතේ වූ අරමුදල් මාරු කිරීම හා කොන්ත්‍රාත් දයක මුදල් රු.මිලියන 7 හා රු.මිලියන 14 ක් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

අධිකාරියේ අගය එකතු කිරීම සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.10,044,982 ක් වුවද වර්ෂයේ බදු, සේවක පරිශ්‍රමික හා ක්ෂය වීම් වෙනුවෙන් රු.304,056,959 ක් හා එය පෙර වර්ෂයේ රු.268,634,038 ක් විය. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව අධිකාරියේ අගය එකතු කිරීම රු.35,422,921 ක් හෝ සියයට 13.18 වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ දායකත්වය රු. මිලියන 46 හා මුළු වත්කම රු. මිලියන 1,388 ක් ද 233 ක කාර්ය මණ්ඩලය උපයෝජනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ලාභය රු. මිලියන 10 ක් විය.

(ආ) ඉකුත් වර්ෂයේ සියයට 0.72 ට සාපේක්ෂ සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ ඌනතාවය මුළු වත්කම් වලින් සියයට 0.63 ක් නියෝජනය වූ අතර එයින් සියයට 0.09 ක සුළු වර්ධන තත්ත්වයක් දැක්වුණි.

(ඇ) ක්‍රියාකරු පුහුණු මධ්‍යස්ථානයේ (OTC) හා ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETARC) 2017 වර්ෂයේ රු.මිලියන 12.1 හා රු.මිලියන 8.4 ක මෙහෙයුම් අලාභයක් පිළිවෙලින් සිදු වී තිබූ අතර ශුද්ධ ලාභ අනුපාතය සියයට 32.7 ක හා 55.5 ක අවාසිදායක තත්ත්වයන් පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ආදායම් ශීර්ෂ 20 න් 14 ක ආදායම අඩුවීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.10,900,630 කින් පහත වැටී තිබුණි.

(ආ) අධිකාරිය 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරි පනතේ පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

| පනතේ විධිවිධාන සඳහා යොමුව | ඉලක්ක කල කාර්යය |
|---|---|
| 19 (1) - | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම. |
| 26 - | සහතික ලත් කම්ටු මඟින් තැනැත්තන්ගේ නාමලේඛණය පැවැත්වීම. |
| 41 - | දේපල සංවර්ධකයන්ගේ නාමලේඛණය පැවැත්වීම. |
| 43 - | ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සපයන්නන්ගේ නාමලේඛණය පවත්වා ගැනීම. |
| 45 - | තාක්ෂණික විගණනයන් සිදු කිරීම. |
| 52 - | තීරකවරුන්ගේ නාමලේඛණයක් පවත්වා ගැනීම. |
| 53 - | අභියාචනා මණ්ඩලය පිහිටුවීම. |
| 55 - | ඉදිකිරීම් කර්මාන්තය සඳහා ජාතික දත්ත පද්ධතියක් පවත්වා ගැනීම. |

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1996 වර්ෂයේ සිට මුල්‍ය ප්‍රකාශනවල වාර්ෂිකව විදේශ ආධාර ගිණුමේ පැවත එන රු.2,663,659 ක ශේෂය මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවීමට ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට භාණ්ඩාගාරයෙන් ලැබූ මූලධන ප්‍රදාන එකතුව රු.25,147,139 ක් නියමිත කාර්යයන්ට නොයොදා බැංකු ගිණුම්වල රැඳී තිබුණි.

(ඇ) ක්‍රියාකරු පුහුණු මධ්‍යස්ථානය (OTC) හා ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම වූ, සීඩා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් 2016 වර්ෂයේ ඉලක්කගත අභ්‍යන්තර ඉපැයීම් කරා ලගා වී නොතිබුණි. පුහුණු වැඩසටහන් පැවැත්වීමෙන් හා යන්ත්‍රෝපකරණ කුලියට දීමෙන් සියයට 57.1 ක් හා සියයට 83.1 ක ප්‍රතිශතයක් පමණක් ඉලක්කගත ආදායම ලගාකර ගැනීමට කටයුතු කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) 2016 හා 2017 වර්ෂයන්හිදී භාණ්ඩාගාරයෙන් ප්‍රග්ධන ප්‍රතිපාදන යටතේ ලද රු.4,127,769 ක් වටිනා හයිඩ්‍රොලික් පුහුණු කට්ටල හා රු.2,660,614 ක් වටිනා පුහුණු ද්‍රව්‍ය 2018 ජුනි දක්වා අපේක්ෂිත කාර්යයට යොදවා නොතිබුණි.

(ඉ) ජපානයේ පවත්වන ලද මොබයිල් ක්‍රේන් පුහුණු පාඨමාලාව සඳහා පුහුණු මධ්‍යස්ථානවල පුහුණු උපදේශකයන් වෙනුවට අධිකාරියේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂක ජපානයේ පැවති පුහුණු පාඨමාලාව සඳහා සහභාගී වී තිබුණි. තවද ඉහත නිලධාරීන් දෙදෙනා විසින් පසුගිය වර්ෂ දෙක ඇතුලත කිසිදු පුහුණු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ සිට පැවත එන රු.8,470,609 ක් වූ මූලා ප්‍රකාශනවල දැක්වෙන ණයහිමි ශේෂය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගෙන ජ'නල් සටහන් මඟින් කාරක ප්‍රාග්ධන ගිණුමට හා වියදම් ගිණුම්වලට මාරුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් ලිඛිතව ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් කරන ලද ඉල්ලීමකට අනුව පරිත්‍යාග ලෙස එකතු කරන ලද රු.1,020,000 ක මුදල් යොදාගෙන අධිකාරිය විසින් අමාත්‍යාංශයට ගෙවන ලද රු.250,000 ක මුදල් අත්තිකාරම පියවීමට යොදා ගෙන තිබුණි.

**4.4 නොවිසඳුණු විගණන ඡේද**

1997 සිට 2004 වර්ෂය දක්වා මෝටර් රථ පිරියත හා යන්ත්‍රෝපකරණ කුලියට ගැනීම වෙනුවෙන් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයෙන් ලැබිය යුතු එකතුව රු.114,529,393 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් නොලැබී එලෙස රැඳී තිබුණි. කෙසේ වුවද, එම ලැබිය යුතු ශේෂය සඳහා මූලා ප්‍රකාශනවල සම්පූර්ණ ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

**5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**5.1 ප්‍රසම්පාදන කළමනාකරණය**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.9.1 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන ආයතනය විසින් රු.500,000 ඉක්මවන ලංසුකරුට විධිමත් ප්‍රතිග්‍රාහක ලියුමක් නිකුත් කල යුතුය. එසේ වුවද, එකතුව රු.4,110,062 ක් වූ අවස්ථා කිහිපයකදී කල ප්‍රසම්පාදනයන් වෙනුවෙන් ප්‍රතිග්‍රාහක ලිපියක් අධිකාරිය විසින් නිකුත් කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) පුහුණු පාඨමාලා ආදායම | පුහුණු පාඨමාලා සංයුතිය යාවත්කාලීන නොකිරීමෙන් ඉදිකිරීම් කර්මාන්තයට අදාල නොවන පාඨමාලාවන් පැවැත්වීමෙන් පුහුණු පාඨමාලා ආදායමේ පහත වැටීම් සිදුවී තිබුණි. |

| | |
|---|---|
| (ආ) තොග පාලනය | භෞතික සත්‍යාපන කළ තොග ශේෂය ගැනීම වෙනුවට ලෙජර ශේෂය ගිණුම් වලට ගෙන තිබුණි. |